**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය පකාශන 2013 අප්‍රේල් 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 සැප්තැම්බර් 14 දින මිලදී ගෙන තිබූ ළමා පුස්තකාල මේස 03 ක්, ළමා පුස්තකාල පුටු 20 ක් හා පුවත් පත් පුවරු 01 ක වටිනාකම පිළිවෙලින් රු.16,500 ක් රු.29,000 ක් හා රු.14,650 ක් වශයෙන් එකතුව රු.60,150 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ වෙන් කිරීම් සිදුකර තිබූ රු.378,619 ක් වූ ණයහිමියන් සඳහා 2013 වර්ෂයේ ද නැවතත් ප්‍රතිපාදන වෙන් කර තිබීම නිසා වර්ෂයේ වියදම හා ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කර්මාන්ත ව්‍යාපාති 06 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම ලෙස එකතුව රු.2,862,419 ක් ගිණුම් ගත කර තිබුණද ගෙවිය යුතු මුදල රු.2,095,613 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම හා ණයහිමි ශේෂය රු.766,806 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සාහිත්‍ය උත්සවය සඳහා අවස්ථා 3 කදී ලබා දී තිබූ රු.94,960 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින පියවා තිබුණද ඊට අදාල වියදම් ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථයේ වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂය අවසානයට අගලවත්ත ප්‍රාදේශීය සභාව නමින් වූ ණයහිමි ගිණුමේ ශේෂය රු.6,862,871 ක් වුවද, සමාලෝචිත වර්ෂය ආරම්භයට එය රු.8,862,871 ක් ලෙස ලෙජර ගිණුමට සටහන් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.2,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශ අනුව කර්මාන්ත අත්තිකාරම් ලැබීම් රු.2,737,000 ක් හා ඒකාබද්ධ වැය සාරාංශය අනුව කර්මාන්ත අත්තිකාරම් ගෙවීම් රු.2,060,000 ක් දක්වා තිබුණද එම සටහන් කිසිදු ගිණුමකට ගිණුම් ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,388,534 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,499,615 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,111,081 ක පිරිහීමක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 2,511 | 2,191 | 348 |
| (ii.) | බදු කුලී | 3,636 | 2,357 | 279 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 178 | 178 | -- |

2:2:2 බදු කුලී

2013 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී ශේෂය රු.258,463 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉරුදින පොළ බදුදීමට අදාල ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව මාසික වාරිකය ගෙවීම ප්‍රමාද කරන එක් දිනයක් වෙනුවෙන් සෑම රුපියල් දාහේ ඒකකයකටම රු.5 බැගින් වූ අතිරේක දඩ මුදලක් හා මාසයකට වැඩි කාලයක් මුදල් ගෙවීම පැහැර හැරියහොත් කිසිදු දැනුම්දීමකින් තොරව බද්ද අවලංගු කිරීමත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද කාලය වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.390,744 ක් දඩ වශයෙන් බදුකරුගෙන් අය කළ යුතු වුවත්, ප්‍රමාද ගාස්තු වශයෙන් රු.34,400 ක් පමණක් ලේඛනවල පෙන්වා තිබුණි.

(ඇ) සභාවට නිසි ආකාරයට පොල බදු ගෙවා නොතිබුණ ද බදු කරු විසින් නොකඩවා ඉරුදින පොලේ බදු අයකර තිබූ බව විගණනයේදී අනාවරණය විය.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

(i) උසාවි දඩ 2,555,157
(ii) මුද්දර ගාස්තු 3,231,587

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 අවිධිමත් ගනුදෙනු
---------------------

2013 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ විවිධ ගොවි සංවිධාන හා සමිති සමාගම් වෙත ලබාදීම සඳහා එකක් රු.880 බැගින් පුටු 1360 ක්, රු.1,196,800 ක් ගෙවා මිලට ගෙන තිබණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව රු.1,196,800 ක් වූ මෙම මිලදී ගැනීම සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2013 අප්‍රේල් 03 දින සභාවට ලැබි තබූ රු.598,400 ක් වටිනාකමැති පුටු 680 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනය අනුව 2013 අප්‍රේල් 07 දින නිකුත් කර තිබූ නමුත් ඒවා භාරගත් පුද්ගලයෙකු සඳහන් නොකර සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම පරිදි අදාල සමිති වෙත ලබා දුන් බව පමණක් දක්වා තිබුණි. තවද 2013 දෙසැම්බර් 06 දින සභාවට ලැබී තිබූ පුටු 680 කින් පුටු 200 ක් නිකුත් කර තිබූ අතර ඒ සඳහා පමණක් භාණ්ඩලාගීන් විසින් භාර ගත් බවට අත්සන් කර තිබුණි.

(ඇ) විගණිත දිනය වූ 2014 ජුනි 28 වන විට ලේඛන අනුව නිකුත් නොකළ පුටු 480 කින් පුටු 280 ක තොගයක් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර ඉතිරි පුටු 200 සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් ඉදිරිපත් නොවුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

(අ) <u>හැඩිගල්ල ජනපදයේ රබර් සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම</u>

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ තුරු සවිය අරමුදල මගින් ඉහත කර්මාන්තය සඳහා 2012 ජුනි 15 දින රු.1,200,000 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණි. හැඩිගල්ල ජනපදයේ ඉදි කර තිබූ මෙම සමූහ සැකසුම් මධ්‍යස්ථානය සඳහා රු.1,007,920 ක් වියදම් කර තිබූ අතර ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට කොන්ත්‍රාත්තුව හැඩිගල්ල ජනපදයේ තුරු සවිය සමිතියට ලබා දී තිබුණි. මෙම රබර් සැකසුම් මධ්‍යස්ථානය, (2014 ජුනි 30 දින සභාවේ කාර්මික නිලධාරියා සමඟ) පිළිබඳ සිදුකළ භෞතික පරීක්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රධාන මාර්ගයේ සිට ගොඩනැගිල්ල දක්වා මාර්ගය සකස් කිරීමට ඩෝසර් යන්ත්‍ර යෙදීම හා අවහිර ගස් ඉවත් කිරීම වෙනුවෙන් මීටර් පැයකට රු.2,500 බැගින් පැය 10 ක් සඳහා රු.25,000 ක් ඇස්තමේන්තු කර තිබූ අතර 2012 දෙසැම්බර් 08 දිනැති තාක්ෂණ නිලධාරීගේ අවසන් ගෙවීම් වාර්තාව අනුව ඉහත කාර්යය සඳහා මීටර් පැය 22 ක් සඳහා රු.55,000 ක් නිර්දේශ කර ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.30,000 ක් ගෙවා තිබුණි.

(ii) ඇස්තමේන්තුවේ විෂය අංක 05 යටතේ විනාශ වී ඇති ඇළුමිනියම් රැළි තහඩු වෙනුවට දිග අඩි 12 ක් වූ ඇළුමිනියම් රැළි තහඩු 15 ක් සපයා ගැනීම සඳහා රු.3,000 බැගින් රු.45,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එසේ වුවද, ඇස්තමේන්තු සංශෝධනය කිරීමෙන් තොරව හා ඇස්තමේන්තුගත රැළි තහඩු ගණනට වඩා වැඩියෙන් මිලදී ගැනීම සඳහා වූ අවශ්‍යතාවය සඳහන් නොකර රැළි තහඩු 30 ක් සඳහා රු.90,000 ක් ගෙවීම් කර තිබීමෙන් ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.45,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) <u>හැඩිගල්ල ජනපදයේ තුරුසවිය සමිතියේ සමූහ සැකසුම් මධ්‍යස්ථානයේ දුම්ගෙය ඉදිකිරීම</u>

තුරු සවිය අරමුදලින් ඉහත සඳහන් රබර් සැකසුම් මධ්‍යස්ථානයට අවශ්‍ය දුම් ගෙය ඉදි කිරීමේ ව්‍යාපෘතිය රු.1,428,515 ක් වූ ගිවිසුම්ගත බැඳීමකට හැඩිගල්ල ජනපදයේ තුරු සවිය සමිතියට 2013 මැයි 02 දින ලබා දී තිබුණි. 2014 ජුනි 30 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) 2013 අප්‍රේල් 26 දිනැති තුරුසවිය අරමුදලේ අධ්‍යක්ෂක විසින් දුම් කුටීර 2 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කළද රබර් පර්යේෂණායතනයේ නිර්දේශය අනුව එක් දුම් කුටීරයක් ඉදිකිරීමට උපදෙස් ලබා දී තිබූ අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස සභාවට දැනුම් දී තිබුණි. එම උපදෙස් අනුව කටයුතු නොකර ආරම්භයේ සකස් කර තිබූ සැළසුම් අනුව දුම් කුටීර 2 ක් ඉදිකර තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) ඇස්තමේන්තුවේ අයිතම අංක 25 අනුව ට්‍රොලිවලට කිතුල් පොලු සවිකිරීම සඳහා රු.65,000 ක් ඇස්තමේන්තු කර ඇතත් සවි කළ යුතු කිතුල් පොලු සංඛ්‍යාව කොපමණද යන්න සඳහන් කර නොතිබුණි. කෙසේ වුවද අවසන් ගෙවීම් වාර්තාව අනුව රු.65,000 ක් වූ සම්පූර්ණ මුදලම ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

3.3 <u>කල් ඉකුත් වූ තැන්පත්</u>

1997 සිට 2011 දක්වා කාලයට අදාල රු.489,938 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571, 571(2) හා 571 (3) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

3.4 <u>වාහන පාලනය</u>

පළාත් පාලන අමාත්‍යාංශයෙන් 2008 ජනවාරි 11 දින ලැබී තිබූ රු.1,319,050 ක් වූ කැබ් රථයේ සම්පූර්ණ අළුත්වැඩියාවක් සඳහා 2013 පෙබරවාරි මසයේ දී එහි ඒජන්තවරුන් වෙත වාහන භාර දී තිබූ අතර මාස 3 1/2 ක පමණ කාලයක් ගත වීමෙන් පසු අළුත්වැඩියාවට අදාල රු.564,582 ක ඇස්තමේන්තුවක් සමාගම විසින් එවා තිබුණ. 2014 ජුනි 30 වන දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විටත් අදාල වාහනය සභාව වෙත ගෙන්වා ගෙන නොතිබුණ අතර ලේකම්වරයාගෙන් ඒ පිළිබඳ කළ විමසීමේදී අළුත්වැඩියා වියදම අධික වීම නිසා එම අළුත්වැඩියාව නොකර වෙන්දේසි කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයා වාචිකව උපදෙස් ලබා දුන් බව දන්වා සිටින ලදී. වර්ෂයකට අධික කාලයක් තිස්සේ වාහනය සභාවට ගෙන්වාගෙන එය වෙන්දේසි කිරීමට කටයුතු නොකිරීමත් වෙනත් ආයතනයක අව්වට හා වැස්සට නිරාවරණය වෙමින් දිරාපත් වීමත් නිසා වාහනයේ වෙළඳපොල අගය තව තවත් පහළ යා හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.5 කසළ බඳුන් බෙදා දීම

----------------------

බස්නාහිර පළාත් පාලන සහකාර කොමසාරිස් වරයාගේ 2013 දෙසැම්බර් 02 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව මුදලට හා ආබාධිත අඩු ආදායම්ලාභීන් වැනි අයට නොමිලයේ බෙදාදම සඳහා වටිනාකමින් 50% ක් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ගෙවීමේ පදනම මත ලීටර් 20 කසල බඳුන් 200 ක් සභාව වෙත ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කසල බඳුන් වෙනුවෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යැවිය යුතු 50% ක් වූ රු.33,560 ක මුදල 2014 ජුනි 30 වන විටත් යවා නොතිබුණි.

(ii) 2014 ජුනි 30 දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විටත් කසල බඳුන් කිසිවක් බෙදා නොහැර ගබඩාවේ රඳවා ගෙන තිබූ අතර කසල කළමනාකරණ ජාතික වැඩසටහන සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.6 <u>ගබඩා පාලනය</u>

(i) ගබඩාවට ලැබෙන සියළුම භාණ්ඩ ලැබීම් සටහනක් මගින් හා නිකුත් කිරීම් නිකුත් කිරීමේ කුවිතාන්සියක් මගින් සිදු කළ යුතු වුවද ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම් කිසිවක් වෙනුවෙන් නිකුත් කිරීමේ කුවිතාන්සි භාවිතා කර නොතිබුණි.

(ii) සභා අරමුදලින් රු.100,000 කට මිලට ගෙන තිබූ පුස්තකාල පොත් 479 ක් සඳහා ගබඩා ලැබීම් හෝ නිකුත් කිරීම් කුවිතාන්සි ලියා නොතිබුණි.

3.7 <u>නිරවුල් නොකළ ගිණුම්</u>

2006 වර්ෂයේදී පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සහ අගලවත්ත ප්‍රාදේශීය සභාව වශයෙන් වෙන්කර වෙනම ඒකක ලෙස සංස්ථාපනය කිරීමේදී වූ රු.6,166,799 ක් වූ ලැබිය යුතු ශේෂයද, රු.8,862,872 ක් වූ ගෙවිය යතු ශේෂයද පදනම් කරගෙන ගිණුම් සකස් කර තිබුණද එම ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැයකරණය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය